# දකුණු පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිශ්‍රේණිගත කිරීම

# නිර්ණායක අත්පොත

# 2021/2022

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

## දකුණු පළාත

# දකුණු පළාතේ සමුපකාර සමිති ශ්‍රේණිගත කිරීම - 2021/2022

**හැඳින්වීම**

දකුණු පළාතේ සමුපකාර ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම සාධනය කරමින් ධනාත්මක අභිප්‍රේරණයන් සහිතව සංවර්ධනාත්මක ගමනකට දිශාගත කරනු පිණිස කාර්යක්ෂම හා ඵලදායි සමුපකාර සමිති ඇගයීම පිණිස දකුණු පළාත් සමුපකාර අමාත්‍යාංශයේ උපදේශකත්වය යටතේ දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාවට නංවන වැඩසටහනකි.

**මූලික කරුණු**

- දකුණු පළාත තුළ මෙම ශ්‍රේණිගත කිරීම හා කාර්යසාධන තරඟාවලිය දෙවන වරට සංවිධානය කරනු ලැබේ.
- ඇගයුම් කිරීම 2022 වර්ෂය පදනම් කර ගනිමින් 2024 වර්ෂයේදී සිදු කරනු ලැබේ.
- අයදුම්පත් නිවැරදිව, පැහැදිලිව හා විධිමත්ව ඉදිරිපත් කිරීම ඇගයුම් කටයුතු වලදී සැලකිල්ලට ගන්නා බැවින් ඔබගේ ප්‍රමුඛ අවධානය ඒ සඳහා යොමු විය යුතුය.
- දකුණු පළාතේ ලියාපදිංචි සියළුම සමුපකාර සමිති හා සංගම් මෙම ශ්‍රේණිගත කිරීම හා කාර්යසාධන තරඟාවලිය සඳහා තොරතුරු ඉදිරිපත් කල යුතුය.
- තොරතුරු ඉදිරිපත් කරන සියළුම සමිති ශ්‍රේණිගත කිරීම සඳහා අදාල කර ගන්නා අතර 2023.05.30 දින දක්වා වන මුදල් වර්ෂයට අදාලව සම්පූර්ණ අවසාන ගිණුම් සකස්කර එකී ගිණුම් දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර ඇති සමිති කාර්යසාධන තරඟාවලිය සඳහා අදාල කරගනු ලැබේ.

සමුපකාර සමිති විසින් අත්පොතෙහි දක්වා ඇති නිර්ණායකයන්ට අනුව සනාථ කල හැකි තොරතුරු මත ස්වයං ලකුණු සටහන් කිරීමක් කල යුතුය. මෙම කාර්යය සඳහා ඔබ සමිතියේ වගකිවයුතු නිලධාරීන් හරහා සිදුකර ඔබ වෙත නිකුත්කර ඇති අයදුම්පත විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2024.04.30 දිනට පෙර ඉදිරිපත් කල යුතු අතර එහි නිවැරදි බව සහතික කරමින් සමිතියේ ගරු සභාපති හා සාමාන්‍යාධිකාරී විසින්ම අත්සන් කල යුතුය.

**යෝජිත ඇගයුම් ක්‍රමවේදය**

**අදියර 01 -** සමුපකාර සමිති විසින් ලබාදෙන නිර්ණායකයන්ට අනුව ලකුණු සටහන් පොතෙහි පළමු තීරුවේ සටහන් කල තොරතුරු ඇගයුමට ලක්කෙරේ. එහිදී සමිතිය විසින් ඉදිරිපත් කරන සනාථ කිරීමේ ලේඛණ ඇතුළු අයදුම්පත නිවැරදිව හා විධිමත්ව සම්පූර්ණ කර තිබේදැයි පරීක්ෂා කර, සමිතියේ අවසන් විගණිත වර්ෂයද සලකා බලා දෙවන ඇගයුම් අදියරට සුදුසුකම් ලබන සමිති තෝරා ගනු ලැබේ.

**අදියර 02 -** පළමු ඇගයුමෙන් තෝරා ගන්නා සමිති භෞතිකව ඇගයුම මෙම අදියරේදී සිදුකෙරේ. මෙම ඇගයුම සඳහා සුදුසු පරිදි ඇගයුම් හා අධීක්ෂණ නිලධාරීන් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් පත් කරනු ඇත. මෙම ඇගයුමේදී සමිතිය විසින් සටහන් කල ලකුණු ඇගයුම් නිලධාරීන් විසින් සත්‍යාපනය කරනු ලැබේ. එහෙත් ලකුණු එකතු කර සමිතිය ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව මෙහිදී ගණනය නොකරන අතර ලකුණු සටහන් පොත හා අදාල ලේඛණ සමිති නිලධාරීන් ඉදිරියේ විධිමත්ව මුද්‍රා තබනු ලැබේ.

**අදියර 03 -** මුද්‍රා තබන ලද ප්‍රතිඵල ලේඛණ මුද්‍රා ඉවත් කර ලකුණු එකතු කර ප්‍රතිපල ලේඛණ සකස් කිරීම මෙහිදී සිදුවේ. මෙම අදියර සඳහා ඇගයුම් හා අධීක්ෂණ නිලධාරීන් සුදුසු පරිදි සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් පත් කරනු ඇත.

ශ්‍රේණිගත කිරීමට සමගාමීව කාර්යසාධන තරඟාවලිය පවත්වන්නේ නම් එක් එක් අංශයේ සම්මාන සඳහා තෝරාගන්නා සමිති යළි ඇගයීමක් සිදු කරන අතර එම ඇගයීම මත හේතු පාඨ සැකසීම, වීඩියෝගත කිරීම ඇතුළු කටයුතු සිදු කෙරේ. මෙම අදියරේදී තෝරා ගන්නා සමිති සම්බන්ධ තොරතුරු (ප්‍රතිඵල) සම්මාන දින දක්වා රහස්‍යව තැබෙනු ඇත. එම ඇගයුම සඳහා දකුණු පලාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාගේ මූලිකත්වයෙන් වන කමිටුවක් මඟින් සිදු කෙරේ.

මෙම ශ්‍රේණිගත කිරීමට අදාල පදනම වන්නේ ව්‍යවස්ථාපිත විගණනය සඳහා 2022 වර්ෂයට (2023.05.30දක්වා) අදාලව ඔබ සමිතිය විසින් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් කර ඇති අවසාන ගිණුම් වේ. එහෙත් යම් සමිතියක් 2022 වර්ෂයට අදාල අවසාන ගිණුම් ඉදිරිපත්කර නොමැතිනම්, ඒ සඳහා 2021 වර්ෂයට අදාල අවසාන ගිණුම්ද, 2021 වර්ෂයට අදාල අවසාන ගිණුම් ඉදිරිපත් කර නොමැත්තේ නම් 2020 වර්ෂයට අදාල අවසාන ගිණුම් ද, මෙම ශ්‍රේණිගත කිරීම සඳහා යොදා ගැනීමට අවස්ථාව ඇත. 2021 වර්ෂයට අදාල අවසාන ගිණුම් පදනම් කර ගන්නේ නම් මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 100 ද, 2020 වර්ෂයට අදාල අවසාන ගිණුම් පදනම් කර ගන්නේ නම් මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 200 ද අඩු කරනු ලැබේ. 2020 වර්ෂයට පෙර වර්ෂයක් අදාල කර ගන්නේනම් මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 300 අඩු කරනු ලැබේ.

| කාර්යය | යෝජිත කාලය |
|---|---|
| නිර්ණායක හා අයදුම්පත් පොත් සකසා මුද්‍රණය | **2024.03.30** |
| අයදුම්පත් කැඳවීම | **2024.04.05 – 2024.04.30** |
| විනිශ්චය මණ්ඩල පත්කිරීම හා දැනුවත් කිරීම් | **2024.04.16-2024.04.30** |
| ඇගයුම අදියර 01 | **2024.05.06 -2024.05.30** |
| ඇගයුම අදියර 02 | **2024.06.01 - 2024.06.14** |
| ප්‍රතිඵල සමාලෝචනය | **2024.06.17-2024.06.28** |
| ප්‍රතිඵල නිකුත් කිරීම | **2024.07.06** |

වර්ගීකරණය හා ලබාගත යුතු අවම ලකුණු මට්ටම

| | |
|---|---|
| A ශ්‍රේණිය | - මුළු ලකුණු 800 වැඩි |
| B ශ්‍රේණිය | - මුළු ලකුණු 600-799 අතර |
| C ශ්‍රේණිය | - මුළු ලකුණු 450-599 අතර |
| D + ශ්‍රේණිය | - මුළු ලකුණු 350-449 අතර |
| D ශ්‍රේණිය | - මුළු ලකුණු **350** අඩු |

***** A ශ්‍රේණිය ලබා ගැනීමේදී අපේක්ෂිත ලකුණු 1000 නිරූපනය වන A,B,C යන කොටස් 3 න් සෑම අංශයකින්ම 50% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.**

***** යම් සමිතියක් මෙම ශ්‍රේණිගත කිරීම සඳහා ඉදිරිපත් නොවීම,නිවැරදි තොරතුරු සැපයීම පැහැර හැරීම හෝ අධීක්ෂණය සඳහා අවස්ථාව ලබා නොදීම යන අවස්ථා වලදී ඔවුනට D ශ්‍රේණිය හිමිවනු ඇත.**

අයදුම්පත් ඉදිරිපත් කල යුතු ආකාරය -

දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නිර්ණායක අත්පොත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත හා අදාල ඇමුණුම් **2024.04.15** දිනට පෙර ලැබෙන සේ අංක 147/3, පෙට්ටිගලවත්ත, ගාල්ල ලිපිනයේ පිහිටි දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයට ගෙනවිත් භාර දීම හෝ ලියාපදිංචි තැපැල මගින් යොමු කල යුතුවේ. ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පත හා අදාල අමුණුම් අඟල් 15x10 ප්‍රමාණයේ ලිපි කවරයක බහා මුද්‍රා තබා එහි වම්පස ඉහළ කෙළවරේ **"සමුපකාර සමිති ශ්‍රේණිගත කිරීම -2021/2022"** ලෙස සඳහන් කල යුතුය.

# දකුණු පළාත් කාර්ය සාධන තරගාවලිය

# සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව දකුණු පළාත.

# කාර්ය සාධන තොරතුරු හා ලකුණු ලබා දීමේ පිළිවෙළ

# විවිධ සේවා සමූපකාර සමිති-2021/2022

<u>හැඳින්වීම</u>

විවිධ සේවා සමූපකාර සමිතියක් ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 1000ක් වන අතර A , B හා C වශයෙන් මූලික අංශ තුනකින් කාර්ය සාධනය ඇගයීමට අපේක්ෂිත ය. ලකුණු වෙන් කෙරෙන ආකාරය පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| A | සමූපකාර සමිතියේ ආර්ථික ස්ථායීභාවය | ලකුණු | 500 |
| B | සමූපකාර සමිතියේ සාමාජික හා සමාජ සංවර්ධනය | ලකුණු | 300 |
| C | නෛතික තත්වය | ලකුණු | 200 |
| | **එකතුව** | | **1000** |

කාර්ය සාධනය ලක් කිරීමට A සහ B යන මූලික අංශ දෙකෙහි අන්තර්ගතයන් හා ලකුණු බෙදා හැරීම හෙවත් බර තැබීම පහත සඳහන් පරිදි වේ.

| **A ආර්ථික ස්ථායීභාවය** | ලකුණු |
|---|---|
| 1. ලාභදායීතාවය | 90 |
| 2. හිමිකාරත්වය | 60 |
| 3. ද්‍රවශීලතාවය | 60 |
| 4. ආර්ථික තිරසාර බව | 50 |
| 5. කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය | 65 |
| 6. නව්‍යකරණය හා නිර්මාණකරණය | 20 |
| 7. මානව සම්පත් උපයෝජනය හා සංවර්ධනය | 40 |

| | |
|---|---|
| 8. භෞතික සම්පත් සංවර්ධනය/බාහිර පරිසරය | 25 |
| 9. කළමනාකරණය හා නායකත්වය | 40 |
| 10. අභ්‍යන්තර පාලනය | 50 |
| **එකතුව** | **500** |

| **B සාමාජික හා සමාජ සංවර්ධනය** | ලකුණු |
|---|---|
| 1. සාමාජික සහභාගීත්වය | 75 |
| 2. සාමාජික ප්‍රතිලාභ (ආර්ථික) | 50 |
| 3. සාමාජික ප්‍රතිලාභ (සාමාජීය) | 30 |
| 4. ප්‍රජා සත්කාරය | 20 |
| 5. සමාජ වගකීම | 20 |
| 6. සමූපකාර ගති ලක්ෂණ | 60 |
| 7. ආයතනික අරමුණු හා ප්‍රතිපත්ති ඉටු කිරීම | 45 |
| **එකතුව** | **300** |

**විවිධ සේවා සමූපාකාර සමිතියෙහි ආර්ථික ස්ථායීභාවය - i කොටස (A)**

සමූපකාර සමිතියේ ආර්ථික ස්ථායීභාවය ඇගයීමට අදාළ කරුණුවල විස්තරාත්මක නිර්ණායකයන් හා වෙන් කළ ලකුණු ප්‍රමාණයන් සවිස්තරව පහත ඉදිරිපත් කෙරේ.

(01)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 01 ලාභදායිතාවය** | |
| A.01.01 පාරිභෝගික අංශය දළ ලාභයට ලඟා වීම | 10 |
| A.01.02 වෙනත් අංශ දළ ලාභයට ලඟා වීම | 05 |
| A.01.03 පාරිභෝගික අංශයේ තොග ඵලදායීතාවය | 15 |
| A.01.04 සමස්ථ සමිතියේ ශුද්ධ ලාභ වර්ධනය | 10 |
| A.01.05 ග්‍රාමීය බැංකු අංශයේ ශුද්ධ ලාභ වර්ධනය | 10 |
| A.01.06 ග්‍රාමීය බැංකු හැර සමිතියේ ශුද්ධ ලාභ වර්ධනය | 10 |
| A.01.07 මුළු වත්කම්වලට ඉපැයීම | 10 |
| A.01.08 ග්‍රාමීය බැංකු ලාභය හැර මුළු වත්කම්වලට ඉපැයීම | 20 |
| **එකතුව** | **90** |

(02)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 02 හිමිකාරත්වය** | |
| A.02.01 මුළු ස්කන්ධයට ප්‍රමිත ස්කන්ධ දායකත්වය | 20 |
| A.02.02 මුළු ස්කන්ධයට ප්‍රමිත ස්කන්ධ වර්ධනය | 10 |
| A.02.03 මුළු ස්කන්ධයට ප්‍රමිත සාමාජික කොටස් දායකත්වය | 05 |
| A.02.04 මුළු ස්කන්ධයට ප්‍රමිත සාමාජික ආර්ජීක දායකත්වය | 15 |
| A.02.05 කොටසක ස්කන්ධ දායකත්වය (පොත් අගය) | 10 |
| **එකතුව** | **60** |

**(03)**

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 03 ද්‍රවශීලතාව** | |
| A.03.01 ජංගම වගකීම් පියවීමට ඇති හැකියාව | 15 |
| A.03.02 ක්ෂණික වගකීම් පියවීමට ඇති හැකියාව | 05 |
| A.03.03 ක්ෂණික වගකීම් ඉවත් කිරීමට ඇති හැකියාව | 15 |
| A.03.04 ග්‍රාමීය බැංකු අංශයේ ද්‍රවශීල අනුපාතය | 15 |
| A.03.05 ග්‍රාමීය බැංකු අංශයේ ද්‍රවශීලතා අතිරික්තය | 10 |
| **එකතුව** | **60** |

(04)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 04 ආර්ථික තිරසාර බව** | |
| A.04.01 මෙහෙයුම් තිරසාර බව | 10 |
| A.04.02 ග්‍රාමීය බැංකු අංශයේ තිරසාර බව | 10 |
| A.04.03 ග්‍රාමීය බැංකු අංශය හැර තිරසාර බව | 10 |
| A.04.04 පාරිභෝගික අංශයේ මෙහෙයුම් තිරසාර බව | 15 |
| A.04.05 වෙනත් අංශවල මෙහෙයුම් තිරසාර බව | 05 |
| **එකතුව** | **50** |

(05)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 05. කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය** | |
| **A. 05.01 කාර්යක්ෂමතාවය (පාරිභෝගික අංශය)** | |
| පාරිභෝගික අංශයේ පිරිවැටුම් සීඝ්‍රතාවය | 08 |
| **A.05.02 ණය ගැති කාර්යක්ෂමතාව** | |
| A.05.02.01 ණය ගැති රැඳීමේ කාලය | 06 |
| A.05.02.02 ඉන්ධන ණය ගැති සඵලතාවය | 02 |

| | | |
|---|---|---|
| A.05.02.03 | වෙනත් අංශ ණය ගැති සඵලතාවය | 02 |
| **A.05.03** | **ණය හිමි කාර්යක්ෂමතාවය** | |
| | ණය හිමි රැඳීමේ කාලය | 04 |
| **A.05.04** | **ජංගම වත්කම් කාර්යක්ෂමතාවය** | |
| | ජංගම වත්කම් පිරිවැටුම් අනුපාතය (ග්‍රාමීය බැංකුව හැර) | 04 |
| **A.05.05** | **ග්‍රාමීය බැංකු කාර්යක්ෂමතාවය** | |
| A.05.05.01 | ඒක සේවක ක්‍රියාකාරී ගිණුම් සංඛ්‍යාව | 06 |
| A.05.05.02 | කල්පසු ණය හා ප්‍රවර්ථන ණයවල අනුපාතය | 06 |
| **A.05.06** | **F28 මෙහෙයුම් වාර්තාව** | |
| A.05.06.01 | F28 මෙහෙයුම් වාර්තාව ඉදිරිපත් කිරීම | 04 |
| A.05.06.02 | F28 සමාලෝචනය හා ඉදිරිපත් කිරීම | 08 |
| **A.05.07** | **ඵලදායීතා සංකල්පය** | |
| A.05.07.01 | අනවශ්‍ය දේ ඉවත් කර තිබීම | 03 |
| A.05.07.02 | අවශ්‍ය දේ පිළිවෙළකට තැබීම | 03 |
| A.05.07.03 | සේවා ස්ථානය පිරිසිදුව පවත්වාගෙන යාම | 03 |
| A.05.07.04 | සේවා ස්ථානය මනා පිළිවෙළ අඛණ්ඩව පවත්වාගෙන යාම | 03 |
| A.05.07.05 | පාලනය පිළිබඳ නීති අනුගමනය කිරීමට පුහුණු කිරීම | 03 |
| | **එකතුව** | **65** |

(06)

| විස්තරය | | ලකුණු |
|---|---|---|
| **A. 06** | **නව්‍යකරණය හා නිර්මාණකරණය** | |
| A.06.01 | ආදායම් වර්ධනය සඳහා යොදා ඇති නව්‍යකරණය හා නිර්මාණකරණ වැඩසටහන් | 06 |
| A.06.02 | පිරිවැය අවම කිරීමට යොදා ඇති නව්‍යකරණ හා නිර්මාණකරණ වැඩසටහන් | 06 |
| A.06.03 | ආයතනික පරිසර සකස්වීමේ නව්‍යකරණ හා නිර්මාණකරණය | 04 |
| A.06.04 | ආයතනික ප්‍රතිරූපය ගොඩනැඟීමට කළ වැඩසටහන් | 04 |
| | **එකතුව** | **20** |

(7)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 07 මානව සම්පත් උපයෝජනය හා සංවර්ධනය** | |
| A.07.01 වාර්ෂිකව මානව සම්පත් සැලසුම් කර තිබීම | 04 |
| A.07.02 පිරිස්බල තක්සේරුව අනුව සේවයේ නියුක්ත බව | 04 |
| A.07.03 පිරිස්බල තක්සේරුව අනුව සේවයේ නියුතු ස්ථිර සේවක සංඛ්‍යාව | 03 |
| A.07.04 විධිමත්ව හා යාවත්කාලීනව රැකියා පිරිවිතර හා රැකියා විස්තර සකස්වීම | 04 |
| A.07.05 සේවකයින් බඳවා ගැනීම විධිමත් කාර්ය පරිපාටිවලට අනුකූල වීම. | 02 |
| A.07.06 විධිමත් උසස්වීම් පරිපාටි ක්‍රියාත්මක වීම. | 02 |
| A.07.07 සමස්ත කාර්ය මණ්ඩලයෙන් වෘත්තීය පුහුණු සහතික ලැබූ සංඛ්‍යාව | 06 |
| A.07.08 සමස්ත කාර්ය මණ්ඩලයෙන් කෙටි කාලීන පුහුණුව ලැබූ සංඛ්‍යාව | 03 |
| A.07.09 සේවක සුභ සාධන අරමුදල ඇති කර තිබීම | 02 |
| A.07.10 සේවක අභිප්‍රේරණය | 03 |
| A.07.11 උපයාගත් වැටුප් වර්ධක කලට වේලාවට දී තිබීම | 02 |
| A.07.12 සේවක සමාජ සංරක්ෂණ නිති ක්‍රියාත්මක වීම | 03 |
| A.07.13 සේවක පිරිවැය දළ ලාභයේ ප්‍රශස්ථ මට්ටමක තිබීම | 02 |
| **එකතුව** | **40** |

(8)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 08 භෞතික සම්පත් අත්පත් කර ගැනීම, ආරක්ෂාව, නඩත්තුව හා සංවර්ධනය** | |
| A.08.01 භෞතික සම්පත් සංවර්ධනය කර තිබීම | 07 |
| A.08.02 භෞතික සම්පත් උපරිම ධාරිතාවයෙන් යුක්ත වීම හා නඩත්තුව | 06 |
| A.08.03 භෞතික සම්පත්වල ආරක්ෂාව සඳහා විධිවිධාන යොදා තිබීම | 06 |
| A.08.04 අනවශ්‍ය භෞතික සම්පත් බැහැර කිරීමේ ක්‍රියාදාමයක් පැවතීම | 06 |
| | |
| **එකතුව** | **25** |

## I කොටස (A)

**A.01** ලාභදායීත්වය

**A.01.01** **සමිතියේ පාරිභෝගික අංශය දළ ලාභයට ළඟා වීම (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)**

සමිතියේ සත්‍ය දල ලාභ ප්‍රතිශතය ප්‍රමිත දළ ලාභයට කොතෙක් දුරට ළඟා වී ඇත්දැයි පරීක්ෂා කෙරේ. මෙය වර්ෂයේ සත්‍ය දළ ලාභය සහ සත්‍ය තොග හා සිල්ලර වෙලදාමේ ව්‍යුහය මත ගණනය කරනු ලැබේ.
ලබාගත යුතු ප්‍රමිත දළ ලාභය 10% කි.

**මාස 12 ක සත්‍ය දළ ලාභය X 100 = සත්‍ය දළ ලාභ ප්‍රතිශතය**
**මාස 12 ක සත්‍ය මුළු විකුණුම්**

**පාරිභෝගික අංශයේ සමස්ත ප්‍රමිත දළ ලාභය**
**සත්‍ය දළ ලාභය ප්‍රමිත දළ ලාභයට ළඟා වීම = සත්‍ය දළ ලාභ ප්‍රතිශතය X 100**
**ප්‍රමිත දළ ලාභ ප්‍රතිශතය**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**ලකුණු පදනම**
සත්‍ය දළ ලාභ ප්‍රතිශතය ප්‍රමිත දළ ලාභ අගයට ළඟා වීම මත සමානුපාතිකව ලකුණු හිමිවේ.

**A.01.02** **සමිතියේ වෙනත් අංශ දළ ලාභයට ළඟා වීම ( වෙන් කළ ලකුණු උපරිමය 05 කි.)**

සමිතියේ වෙනත් අංශ සත්‍ය දළ ලාභය ප්‍රමිත දළ ලාභයට කොතෙක් ළඟා වී ඇත්දැයි පරීක්ෂා කෙරේ.
ඉන්ධන අංශය සමඟනම් ප්‍රමිත දළ ලාභ අනුපාතය 3 % කි.
ඉන්ධන අංශය රහිතව නම් ප්‍රමිත දළ ලාභ අනුපාතය 5% කි.
(වෙනත් අංශ ලෙස සලකනු ලබන්නේ පාරිභෝගික අංශය හැර සමිතියේ සෙසු සියළුම ව්‍යාපාරික අංශ වේ.)

**වෙනත් අංශ සත්‍ය දළ ලාභ ප්‍රතිශතය = වර්ෂයේ වෙනත් අංශ දළ ලාභය x 100**
**වර්ෂයේ වෙනත් අංශ විකුණුම්**

**ප්‍රමිත දළ ලාභයට ළඟා වීම = වෙනත් අංශ සත්‍ය දළ ලාභ ප්‍රතිශතය**
**වෙනත් අංශ ප්‍රමිත දළ ලාභ ප්‍රතිශතය**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**ලකුණු පදනම**
වෙනත් අංශ සත්‍ය දල ලාභ ප්‍රතිශතය ප්‍රමිත දළ ලාභ ප්‍රතිශතයට ළඟා වීම මත සමානුපාතිකව ලකුණු හිමිවේ.

**A. 01.03** **පාරිභෝගික අංශයේ තොග ඵලදායිතාවය** (ලකුණු උපරිමය 15 කි.)

මෙම දර්ශකය මගින් වෙලඳාමේ රුපියල් 100 ක තොගයක් වෙනුවෙන් උපයාගත් ආදායම පරීක්ෂා කර බලනු ලැබේ. මෙය ගණනය කිරීම සඳහා පාරිභෝගික අංශයේ පමණක් සත්‍ය තොග ඵලදායිතාවය සහ ප්‍රමිත තොග ඵලදායිතාවය අදාළ කර ගත යුතු ය.

**සත්‍ය තොග ඵලදායිතාවය ගණනය කිරීම**

**අ. සත්‍ය දළ ලාභය** = **වර්ෂයේ සත්‍ය දළ ලාභය x 100 / වර්ෂයේ මුළු විකුණුම් (ඉන්ධන හැර)**

**ආ. සත්‍ය තොග සංසරණ වාර ගණන** = **වර්ෂයේ සත්‍ය විකුණුම් පිරිවැය / සත්‍ය සාමාන්‍ය බඩු තොගය**

**ඇ. සත්‍ය තොග ඵලදායීතාවය** = **සත්‍ය දළ ලාභය x සත්‍ය තොග සංසරණ වාර ගණන**

**ප්‍රමිත තොග ඵලදායීතාවය ගණනය කිරීම**

අ. ප්‍රමිත දළ ලාභය 10% කි.
ආ. ප්‍රමිත තොග සංසරණය වාර 18
ප්‍රමිත තොග ඵලදායිතාවය ගණනය කිරීම = 10x18 = 180

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**ලකුණු පදනම**
සත්‍ය තොග ඵලදායීතාවය ප්‍රමිත තොග ඵලදායිතාවයට ළඟා වීම මත සමානුපාතිකව ලකුණු හිමි වේ.

**A.01.04** **සමස්ත සමිතියේ ශුද්ධ ලාභ වර්ධනය** (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)

මෙම දර්ශකය මගින් සමස්ථ ශුද්ධ ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව ලබා ඇති වර්ධනය සසඳා බලනු ලැබේ.
ප්‍රමිත ශුද්ධ ලාභ වර්ධනය 5% කි.
මෙය ගණනය කරනුයේ පහත දැක්වෙන ආකාරයට ය.

**(මෙම වසර සමස්ථ ශුද්ධ ලාභය - පෙර වසර සමස්ථ ශුද්ධ ලාභය) x 100 / පෙර වසර සමස්ථ ශුද්ධ ලාභය**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ලකුණු ලබා දිමේ පදනම පහත දැක්වේ.
ලාභ ප්‍රතිශත වර්ධනය 5% හෝ ඊට වැඩි ලකුණු 10 යි.
5% ට අඩු වීමේ දි ප්‍රතිශතාත්මකව සාමානුපාතිකව ලකුණු ලැබේ.
වර්ධන ප්‍රතිශය 1% අඩු වීම මත ලකුණු හිමි නොවේ.
වර්ධන ප්‍රතිශතය ඍන (-) අගයක් ලැබීම හෝ පෙර වසරට වඩා මෙම වසර අලාභය වැඩිනම් ලකුණු හිමි නොවේ.

**A.01.05** <u>ග්‍රාමීය බැංකු අංශයේ ශුද්ධ ලාභ වර්ධනය</u> **(වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)**

මෙම දර්ශකය මඟින් ග්‍රාමීය බැංකු අංශයේ ශුද්ධ ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව ලබා ඇති වර්ධනය සසඳා බලනු ලැබේ. ප්‍රමිත ශුද්ධ ලාභ වර්ධනය 10% කි.

මෙය ගණනය කරනුයේ පහත දැක්වෙන ආකාරයට ය.

**(මෙම වසර සමස්ථ ශුද්ධ ලාභය - පෙර වසර සමස්ථ ශුද්ධ ලාභය) x 100**
**පෙර වසර සමස්ථ ශුද්ධ ලාභය**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ලකුණු ලබා දීමේ පදනම පහත දැක්වේ.

ලාභ ප්‍රතිශත වර්ධනය 10% හෝ ඊට වැඩි ලකුණු 10 යි.
10% ට අඩු වීමේ දි ප්‍රතිශතාත්මකව සාමානුපාතිකව ලකුණු ලැබේ.
වර්ධන ප්‍රතිශතය ඍණ (-) අගයක් ලැබීම හෝ පෙර වසරට වඩා මෙම වසර අලාභය වැඩිනම් ලකුණු හිමි නොවේ.
ලාභ වර්ධනය 20% ට වැඩි වන විට ද බර තැබූ පොලිය හා බර තැබූ ණය පොලී අතර පරතරය ප්‍රමිතිය වේ. එය 6%ක් වන අතර ණය පරීක්ෂාකර බැලිය යුතු ය.
මෙම 6% ප්‍රතිශතය පොලී ප්‍රතිශතයද යන්න හා එහි තත්වය පරීක්ෂා කර සාධාරණ හේතු ඉදිරිපත් වේ නම් ලකුණු ලබා දීම සලකා බැලිය හැක.

---

**A.01.06** <u>ග්‍රාමීය බැංකුව හැර සමිතියේ ශුද්ධ ලාභ වර්ධනය</u> **(වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)**

මෙම දර්ශකය මඟින් ග්‍රාමීය බැංකු අංශය හැර ශුද්ධ ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව ලබා ඇති වර්ධනය සැසඳීම කෙරේ. ප්‍රමිත ශුද්ධ ලාභ වර්ධනය 05% කි. මෙය ගණනය කරනුයේ පහත දැක්වෙන ආකාරයට ය.

**(මෙම වසර ග්‍රාමීය බැංකු අංශය හැර සමස්ථ ශුද්ධ ලාභය - පෙර වසර ග්‍රාමීය බැංකු අංශය හැර සමස්ථ ශුද්ධ ලාභය) x 100**
**පෙර වසර ග්‍රාමීය බැංකු අංශය හැර ශුද්ධ ලාභය**

ලකුණු ලබා දීමේ පදනම පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ලාභ ප්‍රතිශත වර්ධනය 5% ට වැඩි | ලකුණු 10 | ලාභ ප්‍රතිශත වර්ධනය 2% ට වැඩි | ලකුණු 04 |
| ලාභ ප්‍රතිශත වර්ධනය 4.5% ට වැඩි | ලකුණු 08 | ලාභ ප්‍රතිශත වර්ධනය 1% ට වැඩි | ලකුණු 02 |
| ලාභ ප්‍රතිශත වර්ධනය 4% ට වැඩි | ලකුණු 06 | ලාභ ප්‍රතිශත වර්ධනය 1% ට | ලකුණු 01 |
| ලාභ ප්‍රතිශත වර්ධනය 3% ට වැඩි | ලකුණු 05 | | |

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

වර්ධන ප්‍රතිශතය 1% ට අඩු වීම මත ලකුණු හිමි නොවේ. වර්ධන ප්‍රතිශතය ඍන (-) අගයක් ලැබීම හෝ පෙර වසරට වඩා මෙම වසර අලාභය වැඩිනම් ලකුණු හිමි නොවේ. ප්‍රතිශත වර්ධනය අතරමැදි තත්ත්වය මත නියමිත ලකුණු ලැබේ.

---

**A.01.07** <u>මුළු වත්කම්වලට ඉපැයීම</u> **(වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)**

මෙම දර්ශකය මඟින් සමිතියේ ශුද්ධ ලාභය මුළු වත්කම් මත ඉපැයිම ගණනය කෙරේ. ප්‍රමිත ඉපැයීම 05% කි.
ගණනය කරනුයේ පහත සඳහන් පරිදි ය.

**ශුද්ධ ලාභය x 100**
**ශේෂ පත්‍රයේ වටිනාකම**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ලකුණු ලබා දීමේ පදනම පහත දැක්වේ.
ඉපැයීම ප්‍රතිශතය 5% හෝ වැඩි ලකුණු 10
5% ට අඩු ප්‍රතිශතය සඳහා සමානුපාතිකව ලකුණු හිමි වේ.ඉපැයීම ප්‍රතිශතය ඍන (-) අගයක් ගැනීමේ දී ලකුණු හිමි නොවේ.

**A.01.08** **ග්‍රාමීය බැංකුව හැර මුළු වත්කම්වලට ඉපැයීම** **(වෙන් කළ ලකුණු උපරිමය 20 කි.)**

මෙම දර්ශකය මඟින් ග්‍රාමීය බැංකු අංශයේ ශුද්ධ ලාභය හැර ඉපැයීම ගණනය කෙරේ. ප්‍රමිත ඉපැයීමේ ප්‍රතිශතය 2% කි.
ගණනය කරනුයේ පහත සඳහන් පරිදි ය.

**ග්‍රාමීය බැංකු ලාභය හැර ශුද්ධ ලාභය x 100**
**ග්‍රාමීය බැංකු අංශය හැර මුළු වත්කම්**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A 1 කොටස ලාභදායීත්වය 90 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

ලකුණු ලබා දීමේ පදනම පහත දැක්වේ.
2% හෝ වැඩි ලකුණු 20 කි.
2% අඩු ප්‍රතිශතයන් සඳහා සමානුපාතිකව ලකුණු හිමි වේ. ලකුණු ලබා දිය යුත්තේ පූර්ණ සංඛ්‍යා වශයෙනි.
ග්‍රාමීය බැංකු හැර ලාභය = { පොදු ලාභය - (ග්‍රාමීය බැංකු ලාභය + ග්‍රාමීය බැංකු පොදු පරිපාලන වියදම්)}

## A.02 හිමිකාරත්වය

**A.02.01** **මුළු ස්කන්ධයට ප්‍රමිත ස්කන්ධ දායකත්වය** **(වෙන් කළ ලකුණු උපරිමය 20 කි.)**

මෙමගින් මුළු වත්කම්වලට සාමාජික හිමිකම ගණනය කෙරේ. ප්‍රමිත මට්ටම 10% කි.
ගණනය කරනුයේ පහත සඳහන් ආකාරයට ය.

**සාමාජික හිමිකම (ස්කන්ධ) x 100**
**මුළු වත්කම් (ශේෂ පත්‍ර වටිනාකම)**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ලකුණු ලබා දීමේ පදනම පහත දැක් වේ.
ප්‍රමිත ප්‍රතිශතය 10% ක් හෝ වැඩි ලකුණු 20 ලබාගත් ප්‍රතිශතය මත සමානුපාතිකව ලකුණු හිමි වේ.

**A.02.02** **මුළු ස්කන්ධයට ප්‍රමිත ස්කන්ධ වර්ධනය** (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)

මෙමගින් මුළු වත්කම්වලට සාමාජික හිමිකමෙහි වර්ධනය පෙර වසරට සාපේක්ෂව ප්‍රමිත මට්ටම සමඟ සැසඳීමට ලක් කෙරේ.
ප්‍රමිත වර්ධන ප්‍රතිශතය 5% කි. ගණනය කරනුයේ පහත දැක්වෙන ආකාරයට ය.

**<u>මෙම වසර ස්කන්ධය - පෙර වසර ස්කන්ධය x 100</u>**
**පසුගිය වසරේ ස්කන්ධය**

ලකුණු ලබා දීමේ පදනම පහත දැක් වේ.
ප්‍රමිත වර්ධන ප්‍රතිශතය 5% ක් හෝ වැඩි ලකුණු 10 ලබාගත් ප්‍රතිශතය මත සමානුපාතිකව ලකුණු හිමි වේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.02.03** **<u>මුළු ස්කන්ධයට ප්‍රමිත සාමාජික කොටස් දායකත්වය</u> (වෙන් කළ ලකුණු උපරිමය 05 කි.)**

මෙමගින් මුළු වත්කම්වලට කොටස් හිමිකම ගණනය කෙරේ. ප්‍රමිත මට්ටම 5% කි. ගණනය කරනුයේ පහත සඳහන් ආකාරයට ය.

**<u>කොටස් හිමිකම x 100</u>**
**මුළු වත්කම්**

මට්ටම 5% වෙනුවෙන් ලකුණු 5 කි. ලබාගත් ප්‍රතිශතය අනුව සමානුපාතිකව ලකුණු හිමි වේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.02.04** **<u>මුළු ස්කන්ධයට ප්‍රමිත සාමාජික ආර්ථික දායකත්වය</u> (වෙන් කළ ලකුණු උපරිමය 15 කි.)**

මෙමගින් මුළු වත්කම්වලට සාමාජික ආර්ථික සහභාගීත්වය ගණනය කෙරේ. ප්‍රමිත මට්ටම 40% කි.
ගණනය කරනුයේ පහත සඳහන් ආකාරයට ය.

**<u>(සාමාජික කොටස් + සාමාජික තැන්පත්) x 100</u>**
**මුළු වත්කම්**

ප්‍රමිත මට්ටම 40% හෝ වැඩි ලකුණු 15 කි. ලබාගත් ප්‍රමිත මට්ටම අනුව සමානුපාතිකව ලකුණු හිමි වේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.02.05** **<u>කොටසක ස්කන්ධ දායකත්වය ( පොත් අගය)</u> (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)**

මෙමගින් කොටසක සාමාන්‍ය පොත් අගය ගණන කෙරේ. කොටසක වටිනාකම රු. 100 ක් ලෙස සැලකිය යුතු ය.

**<u>සාමාජික හිමිකම් (ස්කන්ධය)</u>**
**සාමාන්‍ය කොටස් සංඛ්‍යාව**

ලකුණු ලබා දීමේ පදනම පහත දැක් වේ.

අගය රු. 1000 ක් හෝ වැඩි ලකුණු 10 කි. ලබාගත් අගය මත සමානුපාතිකව ලකුණු හිමි වේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A 2 කොටස හිමිකාරීත්වය 60 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

## A.03 ද්‍රවශීලතාවය

### A.03.01 <u>ජංගම වගකීම් පියවීමට ඇති හැකියාව (ග්‍රාමීය බැංකු අංශය හැර)</u> වෙන් කළ ලකුණු උපරිමය 15 කි.

ග්‍රාමීය බැංකු අංශය හැර ජංගම වත්කම්වලින් ජංගම බැරකම් පියවීමේ හැකියාව මැන බැලේ. ප්‍රමිත මට්ටම 2:1 කි.

ගණනය කරනුයේ පහත සඳහන් ආකාරයට ය.

$$\frac{\text{ජංගම වත්කම්}}{\text{ජංගම වගකීම්}}$$

මෙය ගණනය කිරීමේ දී අක්‍රිය ජංගම වත්කම් හා බැරකම් අඩු කර වටිනාකම ගත යුතු වේ.
ලකුණු පදනම පහත දැක්වේ.

ක්‍රියාකාරී ජංගම අනුපාතය 2 :1 ලකුණු 15
ක්‍රියාකාරී ජංගම අනුපාතය 1.8 :1 ලකුණු 13
ක්‍රියාකාරී ජංගම අනුපාතය 1.6 :1 ලකුණු 11
ක්‍රියාකාරී ජංගම අනුපාතය 1.4 :1 ලකුණු 9
ක්‍රියාකාරී ජංගම අනුපාතය 1.2 :1 ලකුණු 7
ක්‍රියාකාරී ජංගම අනුපාතය 1.1 :1 ලකුණු 5

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ජංගම වත්කම් 1.1 ට අඩු නම් ලකුණු හිමි නොවේ. අතරමැදි මට්ටම නියමිත ලකුණු හිමි වේ.

---

### A.03.02 <u>ක්ෂණික වගකීම් පියවීමේ හැකියාව (ග්‍රාමීය බැංකු අංශය හැර)</u> (වෙන් කළ ලකුණු උපරිමය 05 කි.)

මෙම දර්ශකය මගින් ග්‍රාමීය බැංකු අංශය හැර ක්ෂණික ජංගම වගකීම් පියවීමේ හැකියාව මැන බැලේ. ප්‍රමිත මට්ටම 1:1 කි.
මෙය ගණනය කිරීමේ දී අක්‍රිය ජංගම වත්කම් හා බැරකම් අඩු කළ යුතු වේ.

$$\frac{\text{ජංගම වත්කම් - (ඉතිරි තොග)}}{\text{ජංගම බැරකම්}}$$

ක්‍රියාකාරී ක්ෂණික අනුපාතය 1 ලකුණු 05
ක්‍රියාකාරී ක්ෂණික අනුපාතය 0.8 ලකුණු 4.5
ක්‍රියාකාරී ක්ෂණික අනුපාතය 0.6 ලකුණු 04
ක්‍රියාකාරී ක්ෂණික අනුපාතය 0.4 ලකුණු 3.5
ක්‍රියාකාරී ක්ෂණික අනුපාතය 0.3 ලකුණු 03
ක්‍රියාකාරී ක්ෂණික අනුපාතය 0.2 ලකුණු 02
ක්‍රියාකාරී ක්ෂණික අනුපාතය 0:1 ලකුණු 01

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ක්ෂණික වත්කම් 0.1 ට අඩු නම් ලකුණු හිමි නොවේ. අතරමැදි මට්ටම් සඳහා නියමිත ලකුණු හිමි වේ.

---

**A.03.03** **ක්ෂණික වගකීම් පියවීමේ හැකියාව (පොදු)** **( වෙන් කළ ලකුණු උපරිමය 15 කි.)**

මෙමගින් සමිතියේ ජංගම වත්කම්වලින් කඩිනම් ජංගම වගකීම් ඉවත් කිරීමේ හැකියාව ගණනය කෙරේ. ප්‍රමිත මට්ටම 1:1 කි. මෙය ගණනය කිරීමේ දී අක්‍රීය ජංගම වත්කම් හා බැරකම් අඩු කළ යුතු වේ.

$$\frac{\text{ජංගම වත්කම් - (තොගය)}}{\text{ජංගම බැරකම් - (බැංකු අයිරාව)}}$$

ක්‍රියාකාරී ක්ෂණික අනුපාතය 1 ලකුණු 15
ක්‍රියාකාරී ක්ෂණික අනුපාතය 0.8 ලකුණු 13
ක්‍රියාකාරී ක්ෂණික අනුපාතය 0.6 ලකුණු 11
ක්‍රියාකාරී ක්ෂණික අනුපාතය 0.4 ලකුණු 09
ක්‍රියාකාරී ක්ෂණික අනුපාතය 0.3 ලකුණු 03.5
ක්‍රියාකාරී ක්ෂණික අනුපාතය 0.2 ලකුණු 02
ක්‍රියාකාරී ක්ෂණික අනුපාතය 0:1 ලකුණු 01

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ක්ෂණික වත්කම් 0.1 ට අඩු නම් ලකුණු හිමි නොවේ. අතරමැදි මට්ටම් සඳහා නියමිත ලකුණු හිමි වේ.

**A.03.04** **ග්‍රාමීය බැංකු අංශයේ ද්‍රවශීල අනුපාතය** **(වෙන් කළ ලකුණු උපරිමය 15 කි.)**

මෙමගින් ග්‍රාමීය බැංකු අංශයේ මුළු තැන්පත්වලට ද්‍රවශිල වත්කම් ආවරණය වීම ගණනය කෙරේ. ප්‍රමිත ද්‍රවශිලතාවය 20% කි.
(ද්‍රවශිල වත්කම් යනු අත ඉතිරි මුදල්, ජංගම ගිණුම බැංකු ශේෂ, ඉතිරිකිරීම් ගිණුම් ශේෂ සහ මාස 12 ට නොවැඩි බැංකු ස්ථාවර තැන්පත්)

$$\frac{\text{ග්‍රාමීය බැංකු අංශයේ ද්‍රවශීල වත්කම් + ආයෝජන}}{\text{ග්‍රාමීය බැංකු අංශයේ මුළු තැන්පත්}} \times 100$$

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ප්‍රමිත ද්‍රවශීලතාවය 20% ලකුණු 15 කි. ද්‍රවශීලතා ප්‍රතිශතය අඩුවීම මත සමානුපාතිකව ලකුණු හිමි වේ.

**A.03.05** **ද්‍රවශීලතා අතිරික්ත අනුපාතය (ග්‍රාමීය බැංකු අංශය)** **(වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)**

ද්‍රවශීලතා අතිරික්තය (ග්‍රාමීය බැංකු අංශය) බැංකු නියාමන 01/2013 චක්‍රලේඛය අනුව විය යුතුය.
වෙන් කළ ලකුණු උපරිමය ලකුණු 10 කි.

100% හා ඊට වැඩි 10 ඊට අඩුවන විට ලකුණු හිමි නොවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A 3 ද්‍රවශීලතාවය 60 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

## A.04 ආර්ථික තිරසාර බව

**A.04.01** **මෙහෙයුම් තිරසාර බව (පොදු)** **(වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)**

මුළු ආදායමින් පරිපාලන වැය හා ඌනතාවයන් පියවා ගැනීම තුළින් මෙහෙයුම් තිරසාරත්වය මැන බැලේ. ප්‍රමිත මට්ටම 3.5 ට වැඩි විය යුතු ය.

අංශගත මුළු දළ අතිරික්තයන් + වෙනත් ආදායම්
**අංශගත මුළු වියදම් + පොදු පරිපාලන වැය**

වාර ගණන 3.5 ක් හෝ වැඩි ලකුණු 10 කි. ලබා ඇති වාර ගනන අඩු වන විට සමානුපාතිකව ලකුණු හිමි වේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.04.02** <u>ග්‍රාමීය බැංකු අංශයේ තිරසාර බව</u> **( වෙන් කළ ලකුණු උපරිමය 10 කි. )**

ග්‍රාමීය බැංකු අංශයේ ආදායමින් එම අංශයේ වියදම් පියවා ගැනීමේ හැකියාව මැන බැලේ. ප්‍රමිත මට්ටම 3 ට වැඩිවිය යුතු ය.

<u>**ග්‍රාමීය බැකු අංශයේ ආදායම (ශුද්ධ පොලිය + වෙනත් ආදායම්)**</u>
**ග්‍රාමීය බැංකු අංශයේ මුළු පිරිවැය (පොලි හැර)**

වාර ගණන 03 හෝ ඊට වැඩි නම් උපරිම ලකුණු හිමි වේ. ලබා ඇති වාර ගණන අඩු වන විට සමානුපාතිකව ලකුණු හිමි වේ.
වාර ගණන 01 අඩුනම් ලකුණු හිමි නොවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.04.03** <u>ග්‍රාමීය බැංකු අංශය හැර තිරසාර බව</u> **(වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)**

මෙමගින් ග්‍රාමීය බැංකු අංශය හැර තිරසාරත්වය ගණනය කෙරේ.

<u>**ග්‍රාමීය බැංකු අංශය අතිරික්තය හැර ආංශික ශුද්ධ අතිරික්තය + වෙනත් ආදායම්**</u>
**ග්‍රාමීය බැංකු අංශය හැර මුළු පිරිවැය (පොදු පරිපාලන වැය ඇතුළත්ව)**

වාර ගණන 1.5 හෝ වැඩි ලකුණු 10 යි.
වාර ගණන ඊට අඩු වීමේ දී සමානුපාතිකව ලකුණු හිමි වේ.වාර ගණන 1 ට අඩු නම් ලකුණු හිමි නොවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.04.04** <u>පාරිභෝගික අංශයේ මෙහෙයුම් තිරසාර බව</u> **(වෙන් කළ ලකුණු උපරිමය 15 කි.)**

මෙමගින් පාරිභෝගික අංශයේ තිරසාරත්වය මැන බැලේ.

<u>**පාරිභෝගික අංශයේ මුළු ආදායම (අතිරික්තය + වෙනත් ආදායම්)**</u>
**පාරිභෝගික අංශයේ වියදම + පොදු පරිපාලන දායකත්වය**

ප්‍රමිත මට්ටම වාර 1.25 හෝ වැඩි ලකුණු 10 කි. වාර ගණන ඊට අඩු වන විට සමානුපාතිකව ලකුණු අඩු වේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.04.05** <u>වෙනත් අංශවල මෙහෙයුම් තිරසාර බව</u> **(වෙන් කළ ලකුණු උපරිමය 05 කි.)**

ඉන්ධන අංශයේ මෙහෙයුම් තිරසාරත්වය මැන බැලීම සඳහා යොදා ගැනේ.

<u>වෙනත් අංශවල මුළු ආදායම</u>
**වෙනත් අංශයන්හි වියදම + පොදු පරිපාලන දායකත්වය**

වියදම් පියවීමේ වාර 1.5 හෝ වැඩි ලකුණු 05 වාර ගණන අඩු වීමේ දී සමානුපාතිකව ලකුණු අඩු වේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A 4 ආර්ථික තිරසාර බව 50 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

## A.05 කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය

### A.05.01 කාර්යක්ෂමතාවය (පාරිභෝගික අංශය)

<u>පාරිභෝගික අංශයේ පිරිවැටුම් සීඝ්‍රතාවය</u> **( වෙන් කළ ලකුණු උපරිමය 08 කි.)**

මෙමගින් තොග පිරිවැටුම් සීඝ්‍රතාවය ගණනය කෙරේ. ප්‍රමිත මට්ටම වාර්ෂිකව වාර ගණන 24 කි.

<u>විකුණුම් පිරිවැය</u>
**සාමාන්‍ය තොගය**

ලකුණු පදනම පහත දැක්වේ.
තොග වාර ගණන 24 ලකුණු 06 තොග වාර ගණන 16 ලකුණු 02
තොග වාර ගණන 20 ලකුණු 04 තොග වාර ගණන 12 ලකුණු 01
තොග වාර ගණන 12 ට අඩු නම් ලකුණු හිමි නොවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

### A.05.02 <u>ණය ගැති කාර්යක්ෂමතාව</u>

#### A.05.02.01 <u>ණයගැති රැඳීමේ කාලය</u> **( වෙන් කළ ලකුණු උපරිමය 06 කි.)**

ණයගැති කාර්යක්ෂමතාවය තුළ රැඳීමේ කාලයේ ඵලදායී බව මනිනු ලැබේ. ප්‍රමිත මට්ටම දින 30 කි.

**<u>ණයට වි</u> = වාර ගණන <u>ංශය)</u>**

**සාමාන්‍ය ණයගැතියෝ (පාරිභෝගික අංශය)**

**365 / වාර ගණන = ණයගැති දින ගණන**
ලකුණු පදනම පහත දැක්වේ.
ණය ගැති දින ගණන 30 ට අඩු වීම ලකුණු 06 ණය ගැති දින ගණන 36-39 නම් ලකුණු 04
ණය ගැති දින ගණන 31-35 නම් ලකුණු 05 ණය ගැති දින ගණන 40 නම් ලකුණු 03
ණය ගැති දින ගණන 40 ට වැඩි වූයේ නම් ලකුණු නොලැබේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.05.02.02** **ඉන්ධන ණයගැති සඵලතාවය** **(වෙන්කළ ලකුණු උපරිමය 02 කි.)**

ඉන්ධන ණයගැති සඵලතාවය මැන බැලේ. ඉන්ධන අංශයක් නොවේ නම් **A.05.02.03** ට එම ලකුණු සමානුපාත කරනු ලැබේ.

$$\frac{\text{ඉන්ධන තැන්පත්}}{\text{ඉන්ධන ණයගැතියෝ}} \times 100$$

ඉන්ධන තැන්පත්වලට ඉන්ධන ණයගැති සමාන වීම හෝ ඉක්මවීම ලකුණු 02
ප්‍රතිශතය 100ට අඩු 90ට වැඩි ලකුණු 1.5
ප්‍රතිශතය 90ට අඩු 80ට වැඩි ලකුණු 1.0
ප්‍රතිශතය 80ට අඩු 70 ට වැඩි ලකුණු 0.5

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.05.02.03** **වෙනත් අංශ ණය ගැති සඵලතාවය** **(වෙන්කළ ලකුණු උපරිමය 02 කි.)**

වෙනත් අංශ (පාරිභෝගික හා ඉන්ධන අංශ හැර) ණයගැති සඵලතාවය මනිනු ලැබේ.
ඉන්ධන අංශයක් නොවේ නම් **A.05.02.02** ට මෙම ශීර්ෂයට ලැබෙන ලකුණු ලබා දෙනු ලැබේ.

$$\frac{\text{ණයට විකුණුම් (වෙනත් අංශය )}}{\text{සාමාන්‍ය ණය ගැතියෝ}}$$

ණයගැති සමාන වීම හෝ ඉක්මවීම ලකුණු 02 ප්‍රතිශතය 100ට අඩු 90ට වැඩි ලකුණු 1.5
ප්‍රතිශතය 90ට අඩු 80ට වැඩි ලකුණු 01 ප්‍රතිශතය 80ට අඩු 70 ට වැඩි ලකුණු 0.5

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.05.03.** **ණය හිමි කාර්යක්ෂමතාවය**

**ණයහිමි රැඳීමේ කාලය** **(වෙන්කළ ලකුණු උපරිමය 04කි.)**

ණයහිමියන්ගේ ගිණුම් පියවීමේ ඵලදායි බව මෙමගින් මනිනු ලැබේ. ප්‍රමිත මට්ටම දින 45කි.

$$\frac{\text{ණයට ගැනුම් ( පාරිභෝගික අංශය)}}{\text{සාමාන්‍ය ණය හිමියෝ (පාරිභෝගික අංශය)}} = \text{වාර ගණන}$$

**365 /** වාර ගණන **= ණය හිමි රැඳීමේ** දින ගණන

ලකුණු පදනම පහත දැක්වේ.
ණය හිමි රැඳීමේ කාලය දින 45 ලකුණු 04 ණය හිමි රැඳීමේ කාලය දින 35 ලකුණු 02
ණය හිමි රැඳීමේ කාලය දින 40 ලකුණු 03 ණය හිමි රැඳීමේ කාලය දින 30 ලකුණු 01
ණය හිමි රැඳීමේ කාලය දින 30ට අඩු නම් ලකුණු හිමි නොවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.05.04.** **ජංගම වත්කම් කාර්යක්ෂමතාවය**

**ජංගම වත්කම් පිරිවැටුම් අනුපාතය (ග්‍රාමීය බැංකු අංශයේ හැර)** **( වෙන්කළ ලකුණු උපරිමය 04කි.)**

මෙමගින් ජංගම වත්කම්වල කාර්යක්ෂමතාවය මනිනු ලැබේ. ප්‍රමිත මට්ටම වාර 04කි.

**මුළු විකුණුම්**

**සාමාන්‍ය ජංගම වත්කම් (ග්‍රාමීය බැංකු හැර)**

ලකුණු පදනම පහත දැක්වේ.

ජංගම වත්කම්වල ක්‍රියාකාරි වාර 04 ලකුණු 04 ජංගම වත්කම්වල ක්‍රියාකාරි වාර 02 ලකුණු 02

ජංගම වත්කම්වල ක්‍රියාකාරි වාර 03 ලකුණු 03 ජංගම වත්කම්වල ක්‍රියාකාරි වාර 01 ලකුණු 01

වාර ගණනට 01ට අඩු නම් ලකුණු හිමි නොවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.05.05.** **ග්‍රාමීය බැංකු කාර්යක්ෂමතාව**

**A.05.05.01** **ඒක සේවක ක්‍රියාකාරි ගිණුම් සංඛ්‍යාව ( ග්‍රාමීය බැංකු අංශය )** **(නියමිත ලකුණු උපරිමය 06 කි.)**

මෙමගින් ග්‍රාමීය බැංකු අංශයේ ක්‍රියාකාරි ගණුදෙණුකරුවන්ගේ සංඛ්‍යාව මගින් කාර්යක්ෂමතාවය මනිනු ලැබේ.
ග්‍රාමීය බැංකු අංශයේ ශාඛා කළමණාකරුවන් හා ලිපිකරුවන්, ක්ෂේත්‍ර නිලධාරීන් පමණක් අදාල වේ.

**මුළු ක්‍රියාකාරි ණය හා තැන්පත් ගිණුම් සංඛ්‍යාව ( අඩු කලා අක්‍රීය ගිණුම් )**

**ග්‍රාමීය බැංකු සේවක සංඛ්‍යාව**

ප්‍රමිත තැන්පත්කරුවන්ගේ සංඛ්‍යාව 1500 කි. පරිගණක ගත කර ඇති ශාඛා සංඛ්‍යාව අඩකට වඩා වැඩිනම් ප්‍රමිත තැන්පත්කරුවන්ගේ සංඛ්‍යාව 2500 කි

| පරිගණක ගත නොකල | | පරිගණක ගත කල | |
|---|---|---|---|
| තැන්පත්කරුවන් සංඛ්‍යාව | ලකුණු | තැන්පත්කරුවන් සංඛ්‍යාව | ලකුණු |
| 1500 | 6 | 2500 | 6 |
| 1500-1250 | 5 | 2500 - 1750 | 5 |
| 1250-1000 | 4 | 1750 - 1500 | 4 |

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.05.05.02** **කල්පසු ණය හා ප්‍රවර්ථන ණයවල අනුපාතය** **( නියමිත ලකුණු උපරිමය 06 කි.)**

මෙමගින් කාර්යක්ෂමතාවය මනිනු ලැබේ.

**අක්‍රිය ණය ( මාස 3කට වැඩි අක්‍රිය ණය ) x 100**

**මුළු ණය**

| | | | |
|---|---|---|---|
| 1%ට අඩු | ලකුණු 06 | 1% සිට 2% දක්වා | ලකුණු 05 |
| 2% සිට 3% දක්වා | ලකුණු 04 | 3% සිට 5% දක්වා | ලකුණු 03 |

(සලකා බලනු ලබන දිනය දක්වා කල්පසු ණයට මාරු කර තිබීම මත ලකුණු ලබා දිය යුතුය. 5%ට වැඩි වන විට ලකුණු හිමි නොවේ.

බැංකු නියාමන 03/2013 චක්‍රලේඛය අදාල කර ගන්න)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.05.06** **F28 මෙහෙයුම් වාර්තාව**

**A.05.06.01** **F28 මෙහෙයුම් වාර්තාව ඉදිරිපත් කිරිම** **(වෙන්කළ ලකුණු උපරිමය 04කි.)**

F28 වාර්තාව මාසයේ 15 වන දිනට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරිමේ කාර්යක්ෂමතාවය මනිනු ලැබේ.
ලකුණු දිමේ පදනම මෙසේය.

පෙර මාස වාර්තාව ඊළඟ මස 15 හෝ ඊට පෙර ඉදිරිපත් කිරීම ලකුණු 04
පෙර මාස වාර්තාව ඊළඟ මස 18 හෝ ඊට පෙර ඉදිරිපත් කිරීම ලකුණු 03
පෙර මාස වාර්තාව ඊළඟ මස 20 හෝ ඊට පෙර ඉදිරිපත් කිරීම ලකුණු 02
පෙර මාස වාර්තාව ඊළඟ මස 22 හෝ ඊට පෙර ඉදිරිපත් කිරීම ලකුණු 01

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.05.06.02** **F28 සමාලෝචනය හා ඉදිරිපත් කිරිම** **(වෙන්කළ ලකුණු උපරිමය 08කි.)**

සමාලෝචනය කිරිම වෙනුවෙන් ලකුණු 04 තීරණ ලබා ගෙන ක්‍රියාත්මක කිරීම ලකුණු 04

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.05.07** **ඵලදායිතා සංකල්පය**

**A.05.07.01** **අනවශ්‍ය දේ ඉවත් කර තිබීම** **(වෙන්කළ ලකුණු උපරිමය 03 කි.)**

අනවශ්‍ය දේ ඉවත් කර ඇති බව නිරීක්ෂණය කර සතුටුදායක නම් ලකුණු 03ක් ලබා දිය හැක. සාමාන්‍ය මට්ටමේ පැවතීම මත
එක් ලකුණු ලබා දිය හැකිය. අසතුටුදායක නම් ලකුණු හිමි නොවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.05.07.02** **අවශ්‍ය දේ පිළිවෙළකට තැබීම** **(වෙන්කල ලකුණු උපරිමය 03 කි.)**

ලකුණු ලබා දිමේ නිරීක්ෂණ පදනම A.05.07.01 පරිදිය.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.05.07.03** **සේවා ස්ථානය පිරිසිදුව පවත්වගෙන යාම (වෙන්කල ලකුණු උපරිමය 03 කි.)**

ලකුණු ලබා දිමේ නිරීක්ෂණ පදනම A.05.07.01 පරිදිය.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.05.07.04** **සේවා ස්ථානයේ මනා පිළිවෙල අඛණ්ඩව පවත්වාගෙන යාම (වෙන්කල ලකුණු උපරිමය 03 කි.)**

ලකුණු ලබා දිමේ නිරීක්ෂණ පදනම A.05.07.01 පරිදිය.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.05.07.05** **පාලනය පිළිබඳ නීති අනුගමනය කිරීමට පුහුණු කිරීම** වෙන්කල ලකුණු උපරිමය 03 කි.

ලකුණු ලබා දිමේ පදනම පාලන නීති ස්ථාපිත වීම ලකුණු 01.5 පුහුණුව දී ඇත්නම් ලකුණු 01.5

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A 5 කාර්යක්ෂමතාව හා ඵලදායීතාව 65 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

## A.06. නව්‍යකරණය හා නිර්මාණකරණය

**A.06.01** **ආදායම් වර්ධන වැඩසටහන් (වෙන්කල ලකුණු උපරිමය 06කි.)**

ආදායම් වර්ධනය සඳහා යොදා ඇති වැඩසටහන් වෙනුවෙන් ලකුණු ලබා දීම සිදු කෙරේ. ආදායම් වර්ධන නව්‍යකරණ වැඩසටහන් සහ නිර්මාණකරණ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති බව තහවුරු කළ යුතුවේ.
නව්‍යකරණ හෝ නිර්මාණකරණ වැඩසටහන් සඳහා එක් වැඩසටහනකට ලකුණු 02 බැගින් උපරිමය ලකුණු 06කි.
(නිරීක්ෂණ මට්ටමෙන් ලකුණු ලබා දිය යුතුය. පවත්වන ලද වැඩසටහනක් නිසා ආදායම් වැඩිවීම උපලේඛනයක් මඟින් සනාථ කර තිබිය යුතුය.)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.06.02** **පිරිවැය අවම කිරීමේ වැඩසටහන් (වෙන්කල ලකුණු උපරිමය 06 කි.)**

පිරිවැය අවම කිරීම සඳහා යොදා ඇති වැඩසටහන් වෙනුවෙන් ලකුණු ලබා දීම සිදු කෙරේ. පිරිවැය අවම කිරීමේ නව්‍යකරණ වැඩසටහන් සහ නිර්මාණකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති බව තහවුරු කළ යුතුවේ.
නව්‍යකරණ හෝ නිර්මාණකරණ වැඩසටහන් සඳහා එක් වැඩසටහනකට ලකුණු 02 බැගින් උපරිමය ලකුණු 06 කි.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.06.03** <u>ආයතනික පරිසරය සකස්වීම</u> **(වෙන්කල ලකුණු උපරිමය 04 කි.)**

ආයතනික පරිසරය නවාකරණ හා නිර්මාණකරණ මට්ටම නිරීක්ෂණය කිරීමෙන් ලකුණු ලබා දේ.

ආයතනික පරිසරයේ නව්‍යකරණය සතුටුදායක නම් ලකුණු 02
ආයතනික පරිසරයේ නව්‍යකරණය සාමාන්‍ය නම් ලකුණු 01
ආයතනික පරිසරයේ නිර්මාණකරණය සතුටුදායක නම් ලකුණු 02
ආයතනික පරිසරයේ නිර්මාණකරණය සාමාන්‍ය නම් ලකුණු 01

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.06.04** <u>ආයතනික ප්‍රතිරූපය ගොඩනැගීම</u> **(වෙන්කල ලකුණු උපරිමය 04 කි.)**

ආයතනික ප්‍රතිරූපය ගොඩනැගීම සඳහා ක්‍රියාත්මක කල වැඩසටහන් නිරීක්ෂණය කිරීම තුළින් ලකුණු ලබා දීම සිදු කෙරේ.

ආයතනික ප්‍රතිරූපය ගොඩනැගීම සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන්
සතුටුදායක නම් ලකුණු 04 සාමාන්‍ය නම් ලකුණු 02

- පාරිභෝගික සත්කාර - සාමාජික සත්කාර - සමුපකාර ප්‍රතිපත්ති බලගැන්වීම
- ග්‍රාමීය බැංකු අංශයේ තැන්පත් අවදානමට ලක්වීම, - ඉන්ධනහල්වල අක්‍රමිකතා,
- රුපියල් ලක්ෂ 10 වැඩි බඩු අඩුවීම් සඳහා පියවර නොගැනීම,
- විනයානුකූල වැරදිකරුවන් විධායක තනතුරුවල සිටීම යන කරුණු වලට ලකුණු හිමි නොවේ.
-

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A 6 නව්‍යකරණය හා නිර්මාණ කරණය 20 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

**A.07.** <u>**මානව සම්පත් උපයෝජනය හා සංවර්ධනය**</u>

**A.07.01** <u>මානව සම්පත් සැලසුම්කරණය</u> **(වෙන්කල ලකුණු උපරිමය 04 කි.)**

වාර්ෂිකව මානව සම්පත් සැලසුම්කරණය සඳහා ලකුණු ලබා දෙනු ඇත.
මානව සම්පත් සැලසුමක් සකස් කර තිබීම ලකුණු 04
මානව සම්පත් සැලසුමක් සකස් කර නොමැති නම් ලකුණු හිමි නොවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.07.02** <u>පිරිස් බල තක්සේරුව අනුව සේවයේ නියතු වීම.</u> **(වෙන්කල ලකුණු උපරිමය 04 කි.)**

පිරිස්බල තක්සේරුව අනුව සේවයේ නියුක්ත විම මත ලකුණු හිමිවේ. ප්‍රමිතිය 100%කි.

$$\frac{\text{පිරිස්බල තක්සේරුව අනුව සේවයේ නියුතු සංඛ්‍යාව x 100}}{\text{පිරිස්බල තක්සේරුව අනුව සංඛ්‍යාව}}$$

අනුයුක්ත සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතය 100% ලකුණු 04
අනුයුක්ත සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතය 80% ලකුණු 03
අනුයුක්ත සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතය 60% ලකුණු 02
අනුයුක්ත සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතය 40% ලකුණු 01
40% ට අඩු නම් ලකුණු හිමි නොවේ. (100%) වැඩි වන විට ලකුණු හිමි නොවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.07.03** <u>පිරිස්බල තක්සේරුව අනුව සේවයේ නියුතු ස්ථිර සේවක සංඛ්‍යාව</u> **( වෙන්කල ලකුණු උපරිමය 03 කි)**

පිරිස්බල තක්සේරුව අනුව සේවයේ නියුතු ස්ථිර සේවක සංඛ්‍යාව මත ලකුණු හිමිවේ.

$$\frac{\text{සේවයේ නියුතු ස්ථිර සේවක සංඛ්‍යාව} \times 100}{\text{පිරිස්බල තක්සේරුව අනුව සංඛ්‍යාව}}$$ ප්‍රමිතිය100%

ස්ථිර සේවක සංඛ්‍යාව ප්‍රතිශතය 100% ලකුණු 03 ස්ථිර සේවක සංඛ්‍යාව ප්‍රතිශතය 80% ලකුණු 02
ස්ථිර සේවක සංඛ්‍යාව ප්‍රතිශතය 60% ලකුණු 01

40%ට අඩුනම් හෝ විධිමත් ක්‍රියාපටිපාටි අනුගමනය නොකර සේවකයන් බඳවාගෙන ඇත්නම් ලකුණු හිමි නොවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.07.04** <u>රැකියා පිරිවිතර හා රැකියා විස්තර</u> **( වෙන්කල ලකුණු උපරිමය 04 කි.)**

කාර්ය මණ්ඩලය වෙත විධිමත් හා යාවත්කාලීන රැකියා පිරිවිතර හා රැකියා විස්තර ලබාදී තිබිම මත ලකුණු හිමිවේ.
විධිමත් රැකියා පිරිවිතර හා රැකියා විස්තර ලබාදී ඇත්නම් පමණක් ලකුණු 04ක් හිමිවේ. එසේ නොමැති නම් ලකුණු හිමි නොවේ.
විධිමත් ලෙස පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව සඳහා ලකුණු 02ක් හිමිවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.07.05** **විධිමත් පරිදි සේවකයින් බඳවා ගැනීම (වෙන්කල ලකුණු උපරිමය 02 කි. )**

සේවකයින් බඳවා ගැනීම විධිමත් කාර්ය පටිපාටිවල අනුකුලවීම මත ලකුණු හිමි වේ. සමුපකාර සේවක කොමිෂන් සභා
රෙගුලාසි මත පමණක් සිදුකර තිබීම මත ලකුණු 03කි. එසේ නොමැති නම් ලකුණු හිමි නොවේ.
(ඇගයුම් දිනට සේවයේ නියුතු සේවකයන් බඳවා ගැනීම ඇගයුමට ලක් කෙරේ.)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.07.06** **විධිමත් <u>උසස්වීම් පටිපාටි</u> ( වෙන්කල ලකුණු උපරිමය 02 කි.)**

විධිමත් උසස්විම් පටිපාටිය සකස් කර ක්‍රියාත්මක කිරීම මත ලකුණු හිමි වේ.
උසස්විම් පටිපාටි ක්‍රියාත්මක කර තිබීම ලකුණු 03 කි.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.07.07** <u>කාර්යය මණ්ඩල වෘත්තීය පුහුණුව</u> **(වෙන්කල ලකුණු උපරිමය 06 කි.)**

සමස්ථ කාර්ය මණ්ඩලයේ වෘත්තිය පුහුණු සහතික ලැබු සේවක සංඛ්‍යාව මත ලකුණු හිමි වේ.

සමුපකාර ඩිප්ලෝමා, උසස්පෙළ , සාමාන්‍යපළ, සහතික පත්‍ර වෘත්තිය පුහුණු 6% හෝ ඊට වැඩි ලකුණු 06
සමුපකාර ඩිප්ලෝමා, උසස්පෙළ , සාමාන්‍යපළ, සහතික පත්‍ර වෘත්තිය පුහුණු 5% හෝ ඊට වැඩි ලකුණු 05
සමුපකාර ඩිප්ලෝමා, උසස්පෙළ , සාමාන්‍යපළ, සහතික පත්‍ර වෘත්තිය පුහුණු 4% හෝ ඊට වැඩි ලකුණු 04
සමුපකාර ඩිප්ලෝමා, උසස්පෙළ , සාමාන්‍යපළ, සහතික පත්‍ර වෘත්තිය පුහුණු 3% හෝ ඊට වැඩි ලකුණු 03

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

සමුපකාර ඩිප්ලෝමා, උසස්පෙළ , සාමාන්‍යපළ, සහතික පත්‍ර වෘත්තිය පුහුණු 2% හෝ ඊට වැඩි ලකුණු 02
සමුපකාර ඩිප්ලෝමා, උසස්පෙළ , සාමාන්‍යපළ, සහතික පත්‍ර වෘත්තිය පුහුණු 1% හෝ ඊට වැඩි ලකුණු 01
පුහුණුව ලැබූ බව සනාථ කළ යුතුයි. 1% වඩා අඩුවීම මත ලකුණු හිමි නොවේ.

**A.07.08** <u>**කෙටි කාලීන පුහුණුව**</u> **( වෙන්කල ලකුණු උපරිමය 03 කි.)**

සමස්ත කාර්ය මණ්ඩලයේ කෙටි කාලීන පුහුණුව ලැබූ සංඛ්‍යාව මත ලකුණු හිමිවේ.
සමුපකාර අංශයේ කෙටිකාලින පුහුණුවීම් ලැබූ සංඛ්‍යාව කාර්යමණ්ඩලයේ 10% හෝ ඊට වැඩි ලකුණු 03
සමුපකාර අංශයේ කෙටිකාලින පුහුණුවීම් ලැබූ සංඛ්‍යාව කාර්යමණ්ඩලයේ 08% හෝ ඊට වැඩි ලකුණු 02
සමුපකාර අංශයේ කෙටිකාලින පුහුණුවීම් ලැබූ සංඛ්‍යාව කාර්යමණ්ඩලයේ 06% හෝ ඊට වැඩි ලකුණු 01
පුහුණුව ලැබූ බව සනාථ කළ යුතුයි.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.07.09** <u>**සේවක සුභ සාධක අරමුදල**</u> **(වෙන්කල ලකුණු උපරිමය 02 කි.)**

සේවක සුභ සාධක අරමුදලක් කාරක නියෝග මාලාවක් සහිතව ඇති කර තිබීම සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙනු ලැබේ.

සේවක සුභ සාධක අරමුදලක් ස්ථාපිත කර තිබේ නම් ලකුණු 01
කාරක නියෝග මාලාවක් සකස් කර තිබේ නම් ලකුණු 01

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.07.10** <u>**සේවක අභිප්‍රේරණ ක්‍රම**</u> **(වෙන්කල ලකුණු උපරිමය 03 කි.)**

සමිතිය විසින් නිර්මාණය කර ඇති සේවක අභිප්‍රේරණ ක්‍රම සඳහා ලකුණු හිමිවේ.
සේවක අභිප්‍රේරණ ක්‍රම නිර්මාණය කර තිබීම ලකුණු 01
සේවක අභිප්‍රේරණ ක්‍රම ක්‍රියාත්මක කර තිබීම ලකුණු 01
දිරි දීමනා ක්‍රමයක් සකස් කර ක්‍රියාත්මක කිරීම ලකුණු 01

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.07.11** <u>**වැටුප් වර්ධක නිසි පරිදි ලබා දීම**</u> **( වෙන්කල ලකුණු උපරිමය 02 කි.)**

උපයාගත් වැටුප් වර්ධක නියමිත වේලාවට සේවකයින්ට ලබාදීම මත ලකුණු හිමිවේ.
මාස 03ක් ඇතුලත වැටුප් වර්ධක ලබාදීම වෙනුවෙන් ලකුණු 02 හිමිවේ. එසේ නොමැති නම් ලකුණු හිමි වේ.
මෙහිදි සියළු කාර්ය මණ්ඩලය මෙයට අයත් වේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.07.12** <u>**සේවක සමාජ සංරක්ෂණ නීති**</u> **( වෙන්කල ලකුණු උපරිමය 03 කි.)**

සමාජ සංරක්ෂණ නීති ක්‍රියාත්මක වීම මත ලකුණු හිමිවේ.
අර්ථසාධක හා සේවා භාරකාර දඩ මුදල් ගෙවා නොමැති නම් ලකුණු 01
විශ්‍රාම පාරිතෝෂිත මුදල් අස්වූ සේවකයින්ට ගෙවා තිබීම ලකුණු 01
විශ්‍රාම පාරිතෝෂිත මුදල් විධිමත් පරිදි ආයෝජනය ලකුණු 01

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

A.07.13 **ප්‍රශස්ථ සේවක පිරිවැය හා දළ ලාභය (වෙන්කල ලකුණු උපරිමය 02 කි.)**

සේවක පිරිවැය දළ ලාභයේ ප්‍රශස්ථ මට්ටම මත ලකුණු හිමිවේ. සේවක පිරිවැය දළ ලාභයෙන් 55% නොඉක්ම විය යුතුවේ.
සේවකයින් වෙනුවෙන් දරණ ලද සියළු වියදම් මීට ඇතුලත්වේ. 55%ට වැඩි නම් ලකුණු හිමි නොවේ.

දරණ ලද වැය දළ වශයෙන් 40% ලකුණු 2.0 — දරණ ලද වැය දළ වශයෙන් 50% ලකුණු 1.0
දරණ ලද වැය දළ වශයෙන් 45% ලකුණු 1.5 — දරණ ලද වැය දළ වශයෙන් 55% ලකුණු 0.5

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A 7 මානව සම්පත් උපයෝජනය 40 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

## A.08. හෞතික සම්පත් අත්පත්කර ගැනීම, ආරක්ෂාව නඩත්තුව හා සංවර්ධනය ( ලකුණු 25)

A.08.01. **හෞතික සම්පත් සංවර්ධනය කර තිබීම**

A.08.01.01 දේපළ පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම නඩත්තුව සංවර්ධනය සඳහා ගිණුම් කරන ප්‍රතිපත්තියක් සකස් කර තිබීම. ( ලකුණු 02)

A.08.01.02 දේපළ පිරියත හා උපකරණ ලේඛනයක් නඩත්තු කිරීම. ( ලකුණු 02)

A.08.01.03 හෞතික සම්පත් අත්පත් කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම. ( ලකුණු 03)
(මේ සඳහා පසුගිය වර්ෂ 03 කාලය සලකා බැලේ.)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

A.08.02 **හෞතික සම්පත් උපරිම ධාරිතාවයෙන් යුක්ත වීම හා නඩත්තුව**

A.08.02.01 ගොඩනැගිලි නිසි කලට නඩත්තු කිරීම. ( ලකුණු 02)

A.08.02.02 වාහන, යන්ත්‍ර සූත්‍ර නිසි කලට සේවා කිරීම. ( ලකුණු 02)

A.08.02.03 දේපළ පිරියත හා උපකරණ සඳහා හිමිකම් ලේඛන ගොනු කිරීම. ( ලකුණු 02)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

A.08.03 **හෞතික සම්පත්වල ආරක්ෂාව සඳහා විධිවිධාන යොදා තිබීම**

A.08.03.01 දේපළ පිරියත හා උපකරණ ආරක්ෂාව පිළිබඳ භාරකාරිත්වය පවරා තිබීම ( ලකුණු 02)

A.08.03.02 දේපළ පිරියත හා උපකරණ රක්ෂණය කිරීම. ( ලකුණු 02)

A.08.03.03 හෞතික සම්පත් භාරකාරිත්වයට පත්කළ අයගේ පුද්ගලික ගොනුවලට ලිපි දැමීම. ( ලකුණු 02)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

A.08.04 <u>අනවශ්‍ය භෞතික සම්පත් බැහැර කිරීමේ ක්‍රියාදාමයක් පැවතීම</u>

A.08.04.01 අනවශ්‍ය භෞතික සම්පත් හඳුනා ගැනීම . ( ලකුණු 02)

A.08.04.01 අනවශ්‍ය භෞතික සම්පත් බැහැර කිරීම සඳහා අනුමැතිය ලබා දීම. ( ලකුණු 02)

A.08.04.02 භෞතික සම්පත් බැහැර කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා කාරක නියෝග අනුව ක්‍රමානුකූලව කටයුතු කිරීම. ( ලකුණු 02)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A 8 භෞතික සම්පත් අත්කර ගැනීම 25 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

## A.09. <u>කළමනාකරණය හා නායකත්වය</u>

A.09.01 <u>ව්‍යාපාර තත්ව විශ්ලේෂණය</u> **( වෙන්කල ලකුණු උපරිමය 03 කි.)**

ව්‍යාපාර තත්ව විශ්ලේෂණය කර තිබීම මත ලකුණු හිමිවේ. කළමනාකරණ තීරණ මත සනාථ කළ යුතුවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

A.09.02 **සංවිධානයේ <u>දර්ශනය පිළියෙල කර තිබීම</u>** **(වෙන්කල ලකුණු උපරිමය 01 කි.)**

සංවිධානයේ දර්ශනය පිළියෙල කිරීම කිරීම මත ලකුණු හිමිවේ. කළමනාකරණ තීරණ මත සනාථ කළ යුතුවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

A.09.03 **සංවිධානයේ <u>දර්ශනය ප්‍රචලිත කිරීම</u>** **(වෙන්කල ලකුණු උපරිමය 02 කි.)**

සංවිධානයේ දර්ශනය ප්‍රචලිත කිරීම මත ලකුණු හිමිවේ. කළමනාකරණ තීරණ මත සනාථ කළ යුතුය.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

A.09.04 **සංවිධානයේ <u>මෙහෙවර ප්‍රකාශනය පිළියෙල කර තිබීම</u>** **(වෙන්කල ලකුණු උපරිමය 01 කි.)**

සංවිධානයේ මෙහෙවර පිළියෙල කර තිබීම මත ලකුණු හිමිවේ. කළමනාකරණ තීරණ මත සනාථ කළ යුතුය.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.09.05** <u>**සංවිධානයේ මෙහෙවර ප්‍රකාශනය ප්‍රචලිත කිරීම**</u> **( වෙන්කල ලකුණු උපරිමය 02 කි.)**

